# ප්‍රථම ඉන්දු-යුරෝපීය ප්‍රේම වෘත්තාන්තයෙන් හෙළිවන සමාජ චාරිත්‍ර

තවගමුවේ රේවත හිමි

Owing to its great age and enormous popularity the story of Pururavas and Urvasi appears in many forms throughout the history of Sanskrit Literature. It is the first Indo-European love story known and perhaps may be the oldest love story in the world. It's poetic beauty can be appreciated from several points of view. Firs:ly it is a tale of great love, full of deep feeling and real pathos. Its beauty is quite sufficient to immortalize. Secondly, it contains incidents which strike one as distinctly symbolical and immediately open up a facinating pursuit of theorizing. Thirdly, it has distinct historical and anthropological value and is without doubt the earliest example of nuptial taboos in existence. Lastly the tale appealed to Kalidasa so much that he made it, the theme of his play 'Vikramorvasi' with some of the choicest gems of his poetic genius. In this articale its literary, anthropological and Sociological value is discussed.

ප්‍රථම ඉන්දු යුරෝපීය ප්‍රේම කථාව ලෙසින් ගිණිය හැකි පුරූරවස්-උර්වශී වෘත්තාන්තය විශ්ව සාහිත්‍යයේ ආදිතම පෙම් කථාවද විය හැකිය. සංස්කෘත සාහිත්‍යයේ අවස්ථා කීපයකම සඳහන් වන මෙය කරුණු කීපයක් නිසා වැදගත් වේ.

(1) මෙය ගැඹුරු හැඟීම් ඇති කරන උසස් ප්‍රේමයක් පළ කරන රසාලිප්ත කථාවකි. කථාවට අමතරව කවර කරුණු තිබුණත් මෙම කථාවෙහි අලංකාර ස්වරූපය එය අමරණීය කිරීමට සමත් වේ.

(2) සංකේතාත්මකව කරුණු දැක්වෙන අවස්ථා එහි පවත්නා අතර සැමවිටම ලගන්නා කල්පිතයන් ඉදිරිපත් කිරීමෙන් කථාවෙහි අගය දියුණු වේ.

(3) එහි පැහැදිලිවම මානව විද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකමක් ඇති අතර විවාහ තහංචි පිළිබඳ ප්‍රථම සටහන හැටියට මෙම කථාව වැදගත් වේ.